දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
DISTANCE AND CONTINUING EDUCATION UNIT – UNIVERSITY OF RUHUNA

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය - 2014 අප්‍රේල්
First Examination in Arts (External) - April 2014

දේවිප්‍ර 1.1 - දේශපාලන විද්‍යාවේ මූලධර්ම
PS 1.1 – Elements of Political Science

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

(01) දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය හඳුන්වා දී එය හැදෑරීම සඳහා යොදා ගන්නා අධ්‍යයන ක්‍රමවේද කෙටියෙන් විභාග කරන්න.

(02) ස්වාධිපත්‍ය න්‍යාය නූතන රාජ්‍යයන් ආශ්‍රිතව සාකච්ඡා කරන්න.

(03) බලතල බෙදීමේ න්‍යාය විස්තර කොට එහි ප්‍රායෝගිකත්වය නූතන රාජ්‍යයන් ආශ්‍රිතව පැහැදිලි කරන්න.

(04) "නීතිය" යන්න නිර්වචනය කොට, මිනිසා නීතියට අවනත වන්නේ මන්දැයි පෙන්වා දෙන්න.

(05) "ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් උදෙසා අත්‍යවශ්‍යම උපකරණයක් ලෙස දේශපාලන පක්ෂ හැඳින්වේ." දේශපාලන පක්ෂ කාර්යභාරය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම කියමන විභාග කරන්න.

(06) බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළ කිරීටයේ සහ අගමැති ඇතුළු කැබිනට් මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.

(07) සන්ධීය ආණ්ඩුක්‍රමයක සාර්ථක ක්‍රියාකාරිත්වය උදෙසා තිබිය යුතු කොන්දේසි මොනවා ද?

(08) සමානුපාතික නියෝජන ක්‍රමය හා සරල බහුතර නියෝජන ක්‍රමයේ වාසි අවාසි පෙන්වා දෙන්න.

(09) ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයාගේ බලතල හා තත්ත්වය පැහැදිලි කරන්න.

(10) පහත සඳහන් මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
1. ප්‍රංශ ආණ්ඩු ක්‍රමයේ විධායකය
2. මානව අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම්
3. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම
4. ව්‍යවස්ථානුකූලවාදය

********************************************